# 2. ජාතික ආදයම හා වියදම

## 2.1 සමස්ත උපනතීන්

1999 දී දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) මූර්ත වශයෙන්, සියයට 4.3 කින් වර්ධනය වූ අතර, 1998 වර්ෂයේ එම වර්ධනය සියයට 4.7 ක් විය. 1996 වර්ෂයේදී වූ සියයට 3.8 ක් වූ පහත මට්ටමක වර්ධනය ආවරණය කරමින් වාර්ෂික වර්ධන අනුපාතිකය 1997-1999 කාලච්ඡේදය තුළ සියයට 5.1 ක් තරම් වූ ඉහළ සාමාන්‍යයක් කරා ළඟා විය. ආර්ථිකය, පසුගිය දශකය තුළදී සියයට 5 ක් පමණ වූ වාර්ෂික වර්ධන අනුපාතිකයක් පවත්වාගෙන ගියේය. 1999 ප්‍රථම භාගයේදී ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි වර්ධනය සියයට 3 ක් වූ මන්දගාමී මට්ටමක පැවති නමුත්, වර්ෂයේ තුන්වැනි කාර්තුවේදී විදේශීය ඉල්ලුම් වර්ධනයට ශක්තිමත්ව ප්‍රතිචාර දක්වීමේ ප්‍රතිඵලයක් ලෙස සියයට 4 වර්ධනයක් වාර්තා කරමින් යථා තත්ත්වයට පත්විය. ආර්ථික ප්‍රගතිය වඩා යහපත් දිසාවකට පිවිසීම තවදුරටත් සටහන් කරමින් වර්ෂයේ සිවුවැනි කාර්තුවේදී ද.දේ.නි. හි වර්ධනය සියයට 6.9 ක් කරා ළඟා විය. නැගෙනහිර ආසියාතික රටවල ආර්ථිකයන් ප්‍රකෘති තත්වයට පත්වීමත් සමග එම රටවල විනිමය අනුපාතිකයන් හි අගය ක්‍රමාණුකූලව ඉහළයාම නිසා, අපනයනාභිමුඛ කර්මාන්තයන් සිය තරඟකාරිත්වය නැවත ළඟාකර ගැනීමට සමගාමීව, නිමැවුම් කර්මාන්ත වර්ෂයේ අග භාගයේදී වඩාත් හොඳින් ක්‍රියාත්මක විය.

මෑත වර්ෂවල වූ සමස්ත ආර්ථික ප්‍රතිපත්තීන්හි යහපත් සම්බන්ධීකරණය, සාර්ව ආර්ථික මූලධර්ම වර්ධනය කිරීමෙහි ලා ඉවහල් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අස්ථාවර බාහිර පරිසරයක් හා අසීරු දේශීය තත්ත්වයන් තුළදී වුව අඩු උද්ධමනකාරී තත්වයක් පවත්වා ගැනීමට හැකිවිය. දූරදර්ශී මූල්‍ය කළමනාකරණය හා බැඳුණු මූල්‍ය විනය 1999 වසර තුළදී උද්ධමනය සියයට 5 කට වඩා අඩු සීමාවක රඳවා ගැනීමෙහි ලා උපකාරී විය. 1998 වර්ෂයේ සිවුවැනි කාර්තුවේ සිට අඛණ්ඩව පහත වැටෙමින් තිබූ උද්ධමනයෙහි ප්‍රතිඵලයක් ලෙස පහළ උද්ධමන අපේක්ෂාවන් පවත්වා ගෙන යනු ලැබූ අතර, ඒ නිසා පොලී අනුපාතයන් හා විනිමය අනුපාතයන් කෙරෙහි වූ පීඩනය අවම කෙරිණි. පහත වැටෙමින් පැවතුණු පොලී අනුපාතයන් හා සබැඳුනු පහත මට්ටමේ උද්ධමනය, වඩාත් ඵලදායී වූ ආයෝජන පරිසරයක් නිර්මාණය කළ අතර මෙම තත්ත්වය පෞද්ගලික අංශය ආයෝජනයන් කෙරෙහි පොළඹවන සුළු විය. පහත් උද්ධමන වේගය, වඩා යථාරූපී විනිමය අනුපාතයක් පවත්වාගෙන යාමටද උපකාරී වූ අතර මෙමගින් අපනයන ක්ෂේත්‍රයෙහි උන්නතියක් නිර්මාණය විය.

මේ අතර, රජය විසින් මෑත වර්ෂවලදී පනවනු ලැබූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් වර්ධනය කිරීමෙහි ලා උපකාරී විය. පෞද්ගලීකරණය අඛණ්ඩව පවත්වාගෙන යාම, භාණ්ඩ හා සේවා බද්ද තහවුරු කිරීම, ආනයන බදු යථානුරූපී කිරීම හා බදු අනුපාතයන් පහත දැමීම සහ මූල්‍ය අංශයෙහි කරන ලද ප්‍රතිසංස්කරණ ආදිය මෙම ප්‍රතිසංස්කරණවලට ඇතුළත් වෙයි. ඵලදායිතා වර්ධනය හා ධාරිතාවන් පුළුල්වීම, මෑතදී පෞද්ගලීකරණය කරන ලද වතු වැවිලි හා දුරකථන සන්නිවේදන සේවා අංශයන් තුළ දක්නට ලැබිණ. දුරකථන සන්නිවේදනයෙහි සහ තොරතුරු තාක්ෂණයෙහි පුළුල් භාවිතය තුළින් නිර්මාණය වූ ඵලදායිතා වර්ධනය, නිෂ්පාදන හා සේවා අංශයන්හි එකතු කළ අගය ඉහළ දැමීමෙහිලා ඉවහල් විය. මූල්‍ය අංශයෙහි කරන ලද ප්‍රතිසංස්කරණ, දේශීය මූල්‍ය වෙළඳපොළෙහි සුවිශාල කාර්යක්ෂමතාවයක් ඇතිකිරීමෙහි හා ස්ථාවරත්වයක් ලබා ගැනීමෙහි ලා උපකාරී විය.

ආයෝජනයෙහි වූ වර්ධනය: ප්‍රවාහන, සන්නිවේදන සහ උපයෝගිතා අංශයන්හි නිමැවුම් ධාරිතාවයන් පුළුල් කිරීමෙහිලා ඉවහල් විය. වසර 2000-2004 සඳහා වූ ආයෝජන ප්‍රකාශනය තුළ, ආර්ථික හා සමාජයීය යටිතල පහසුකම් වර්ධනය කිරීමෙහිලා ඉහළ ප්‍රමුඛත්වයක් දෙනු ලැබ ඇත. රාජ්‍ය ආයෝජන වලින් හරි අඩක් පමණ යොදවා ඇත්තේ දුරකථන සන්නිවේදනය, වරාය, බලශක්තිය හා මහා මාර්ග ආදිය නවීකරණය කිරීම සඳහා ය. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙහිලා වැඩි දයකත්වයක් පෞද්ගලික අංශයෙන් ලබා ගැනීම කෙරෙහි අවධානය යොමුකොට ඇත. දනට ඇති කරමින් පවතින මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ හේතුවෙන් වර්ෂය තුළ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනයන්හි නිමැවුම තවදුරටත් වර්ධනය විය. වර්ෂය තුළදී සමස්ත වර්ධනයට සංචාරක අංශයෙන් වූ දයකත්වය ද සැලකිය යුතු වෙයි.

1999 වසර තුළ කෘෂිකාර්මික අංශය ඉතා හොඳින් ක්‍රියාකාරී වූයේ වෙළඳ කටයුතු ලිහිල්කරණයට සමගාමීව සාපේක්ෂ වාසිදයකත්වයෙන් ඉහළ භෝග කරා විතැන්වීම, පෞද්ගලීකරණය යටතේ වඩාත් හොඳ වැවිලි කළමනාකරණය, වැඩිදියුණු කරන ලද වගා ක්‍රම සහ වඩාත් කාර්යක්ෂම බෙදහැරීමේ ක්‍රමෝපායයන් ආදියෙහි වූ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙසටය. කෘෂිකර්ම අංශය, යැපුම් මට්ටමේ නිෂ්පාදනයේ සිට දියුණු තාක්ෂණ භාවිතය මත පදනම් වූ ඉහළ එකතු කළ අගයකින් යුතු නිෂ්පාදන හා වඩාත් උචිත කෘෂිකාර්මික පරිචයන් දෙසට යොමු විය. මෙම ක්‍රියාදමය, කෘෂිකාර්මික අංශය වාණිජකරණය කිරීමට සහ කෘෂි සැකසුම් හා කෘෂි ව්‍යාපාර අංශයන් සංවර්ධනය කිරීමටද ඉවහල් වනු ඇත.

මෙම ක්‍රියාකාරකම් දියුණු කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව මෑතදී හඳුන්වා දුන් "ගොවිසහනය" යෝජනා ක්‍රමය, ගැණුම්කරුවන් සමග පෙර-තීන්දු මිලකට පිවිසීමට ගොවීන් උනන්දු කරවනු ලබයි. මෙමගින් ගොවීන්ගේ ආදයම උච්චාවචනය වීම පහත හෙළීමට අපේක්ෂිත අතර, ගොවියා ව්‍යාපාරික මට්ටමේ වගාවන් කෙරෙහි හා කෘෂි නිෂ්පාදන සැකසුම් ව්‍යාපාර කෙරෙහි උනන්දු කිරීමට පොළඹවනු ඇත.

මෑත වර්ෂවලදී කැපී පෙනෙන සුළු වර්ධනයක් වූයේ අවිධිමත් ගණයේ ක්‍රියාකාරකම්හි නිමැවුම් අඛණ්ඩව

ප්‍රසාරණය වීමය. අවිධිමත් ගණයේ කුඩා හා මධ්‍යම ප්‍රමාණ ව්‍යවසායයන්හි වේගවත් ප්‍රසාරණය කෙරෙහි නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය බලපෑ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රැකියා අවස්ථාවන් විශාල වශයෙන් නිර්මාණය විය. සුළු පරිමාණ ව්‍යවසායයන් අතර, නිමැවුම්හි ප්‍රසාරණය විශේෂයෙන් දක්නට ලැබුණේ ලුහු ඉංජිනේරු, ආපන සේවා, උළු සහ ගඩොල් නිෂ්පාදනය, රථවාහන නඩත්තුව, වායු සමීකරණ, පරිගණක දෘඩාංග සහ මෘදුකාංග සංවර්ධනය, සිල්ලර වෙළඳම, පෞද්ගලික සේවා සහ ගෘහභාණ්ඩ සකස් කිරීම ආදී ආර්ථික කර්තව්‍යයන් තුළය.

1999 වසර තුළදී: කෘෂිකර්මය (සියයට 4.5), පතල් සහ කැනීම් (සියයට 4.1), කර්මාන්ත (සියයට 4.4), ඉදිකිරීම් (සියයට 4.8) සහ සේවා (සියයට 4) වශයෙන් මූර්ත වශයෙන් එකතු කළ අගය ඉහළ ගිය බවට ඇස්තමේන්තු කර ඇත. සමස්ත ආර්ථික වර්ධනය කෙරෙහි සියළුම අංශයන් ධනාත්මක ලෙස දායක වී ඇත. දළ දේශීය නිෂ්පාදනයෙහි වර්ධනයට 1998 දී සියයට 12 කින් පමණක් දායක වූ කෘෂිකාර්මික අංශය, 1999 තුළදී මුළු වර්ධනයෙන් හතරෙන් පංගුවකටම වගකීවේය. නිමැවුම් කර්මාන්ත, ඉදිකිරීම්, පතල් සහ කැනීම් යන අංශයන්හි දායකත්වය පිළිවෙලින් සියයට 20 ක්, සියයට 9 ක් හා සියයට 2 ක් විය. සමස්ත වර්ධනයට තොග සහ සිල්ලර වෙළඳම් අංශයෙන් වූ දායකත්වය 1999 වර්ෂයේදී සියයට 6 ක් පමණක් වූ අතර පසුගිය වසරේදී එය සියයට 22 ක් විය.

දළ ජාතික නිෂ්පාදනය (ද.ජා.නි.) වශයෙන් නිර්වචනය කරනු ලබන විදේශයන්ගෙන් ලත් ශුද්ධ සාධක ආදායමට ගලපන ලද දළ දේශීය නිෂ්පාදනය 1999 වර්ෂයේදී සියයට 3.8 කින් වර්ධනය වූ අතර සංසන්දනාත්මකව පසුගිය වසරේදී එය සියයට 4.6 කි. මෙය ප්‍රධාන වශයෙන් ආයෝජන ආදායම් ලැබීම් ඇ.එ.ජ.ඩොලර් දශ ලක්ෂ 47.2 කින් අඩුවීම සහ 1999 වර්ෂය තුළදී විදේශීය ණය මත පොලී ගෙවීම ඇ.එ.ජ.ඩොලර් දශ ලක්ෂ 6.5 කින් වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය.

වෙළඳපල මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 1,111 ක් පමණ වෙතැයි ඇස්තමේන්තු කර ඇත. මේ අනුව 1999 වර්ෂයේදී ඒක පුද්ගල ද.දේ.නි. ය ඇ.එ.ජ. ඩොලර් 829 ක් පමණ වෙතැයි ඇස්තමේන්තු කර ඇත. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය රුපියල් බිලියන 302 ක් වෙතැයි ඇස්තමේන්තු කර ඇති අතර, එය 1998 වසරට වඩා සියයට 18 කින් වැඩිවීමකි. මේ අනුව ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස ආයෝජනය 1998 දී තිබූ සියයට 25.1 සිට 1999 වර්ෂයේදී සියයට 27.1 දක්වා ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තුගත කොට ඇත.

යටිතල පහසුකම් සංවර්ධනයෙහි වේගවත් දියුණුව හා විදේශීය සෘජු ආයෝජන වලින් ලැබූ සහයෝගය හේතුකොටගෙන රජය සහ පෞද්ගලික යන දෙඅංශයන්හිම ආයෝජන ඉහළ ගියේය. රාජ්‍ය ආයෝජන ප්‍රධාන වශයෙන්: දුරකථන සේවා නවීකරණය කිරීම, වරාය, බලශක්ති සහ මහා මාර්ග ආදියෙහි යෙදවූ අතර එමගින් ප්‍රධාන ආර්ථිකමය අංශයන්හි ඵලදායීතාවය ඉහළ නැංවීය. පෞද්ගලික අංශයේ ආයෝජනයන් වැඩි වශයෙන් යෙදවූයේ නිවාස ඉදිකිරීම්, ගුවන් ප්‍රවාහනය, දුරකථන සන්නිවේදන හා ද්‍රව ගෑස් යන අංශයන් තුළය.

## 2.2 ආංශික ක්‍රියාකාරිත්වය

කෘෂිකාර්මික අංශය, 1999 වසර තුළදී සියයට 4.5 කින් වර්ධනය විය. මෙය, 1993 න් පසු ළඟා කරගත් ඉහළම වර්ධනය විය. ප්‍රධාන වශයෙන් මෙය: වී, පොල්, එළවළු සහ ධීවර නිෂ්පාදනයන් වර්ධනය වීමේ ප්‍රතිඵලයකි. සමස්තයක් වශයෙන් කෘෂි ක්‍රියාකාරිත්වයෙහි අභිවෘද්ධිය පිළිබිඹු කරන ලද ප්‍රධාන සාධකය වන්නේ දේශීය ආහාර නිෂ්පාදනයන්හි මිල ස්ථාවරව පැවතීම හේතුකොටගෙන ආර්ථිකයෙහි උද්ධමන පීඩනය අවම මට්ටමක තබා ගැනීමට හැකි වීමය. 1998/99 මහ කන්නය සහ 1999 යල කන්නය දෙකෙහි ඒකාබද්ධ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,868 ලෙස ට ඇස්තමේන්තු කර ඇති අතර, එය පසුගිය වසරට වඩා සියයට 6.6 ක ඉහළ යාමකි. මෙය, කවර හෝ කාලයක වාර්තා වූ ඉහළම නිෂ්පාදන යයි. මහ කන්නයේදී ලැබූ සාමාන්‍ය අස්වැන්න ඉහළයාම මෙන්ම යල කන්නයේදී අස්වැන්න නෙළූ වපසරිය සියයට 29 කින් ඉහළයාම මෙම සමස්ත වර්ධනයට දායක විය. එළවළු, අතිරේක ආහාර භෝග, සුළු අපනයන භෝග සහ සත්ව පාලනය යන අංශ ප්‍රධාන වශයෙන් ඇතුළත් වන "අනෙකුත් කෘෂිකර්මාන්ත " උප අංශය 1999 වර්ෂයේදී සියයට 3.4 කින් වර්ධනය වූ අතර, එය කෘෂිකර්මාන්ත අංශයෙහි වර්ධනයට තුනෙන් පංගුවකින් දායක විය. එළවළු නිෂ්පාදනය සියයට 6.4 කින් ඉහළ ගිය අතර, පවත්නා වෙළඳ ප්‍රතිපත්තිය මත අල හා මිරිස් වගාවෙන් ලැබෙන ලාභය අඩුවීම හේතුවෙන් ගොවීන් එළවළු වගාවට නැඹුරුවීම මෙම වර්ධනය කෙරෙහි අර්ධ වශයෙන් බලපාන්නට ඇත. යල කන්නයේදී ලැබුණු අති විශාල ලොකු ළූණු අස්වැන්න හා රතුළූණු නිෂ්පාදනය වැඩිවීමේ බලපෑමෙන් අතිරේක භෝග වගා උප අංශයෙහි නිෂ්පාදනය සියයට 1.3 කින් ඉහළ ගියේය. මේ අතරතුර, සත්ව පාලන උප අංශයෙහි මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබුණේ, බිත්තර සහ කුකුල් මස් නිෂ්පාදනය ඉහළ යද්දී, ප්‍රධාන කිරි සැකසුම් කර්මාන්තශාලාවල වරින්වර කිරි එකතු කිරීම පිළිබඳව පැවති බාධක හේතුකොටගෙන කිරි නිෂ්පාදනයෙහි වූ පසු බෑස්මය.

වතු වැවිලි අංශය, සමස්තයක් වශයෙන් 1999 වර්ෂය තුළදී හොඳින් ක්‍රියාකාරි විය. පසුගිය වර්ෂවල වාර්තා වූ ප්‍රවනතාවය තවදුරටත් පවත්වා ගනිමින් තේ නිෂ්පාදනය, කිලෝග්‍රෑම් දශ ලක්ෂ 284 වාර්තා කරමින් නව ඉහළ තලයකට ළඟා වූයේ පසුගිය වසරේ නිමැවුම සියයට 1.3 කින් අභිබවා යමිනි. මෙය ප්‍රධාන වශයෙන්, පෞද්ගලික සමාගම් යටතේ වැඩිදියුණු කරන ලද කළමනාකරණය හා වඩාත් උචිත වගා පුරුදු නිසා සිදු වූවකි. තේ වගා කරන ප්‍රදේශයන්හි වර්ෂය පුරාම පැවති යහපත් කාලගුණික තත්වයන්ද තේ නිෂ්පාදනය ඉහළ දැමීමට දායක විය. දිගින්

දිගටම පහත වැටුණු රබර් නිෂ්පාදනය, 1999 වර්ෂයේදී මඳ ප්‍රමාණයකින් වර්ධනය විය. වසරේ අවසන් කාර්තුවේදී රබර් මිල ගණන්වලද සුළු වැඩිවීමක් දක්නට ලැබුණි. 1986 න් පසු වාර්තා වූ ඉහළම නිෂ්පාදනය වාර්තා කරමින් පොල් නිෂ්පාදනය සියයට 9 කින් ඉහළ ගියේය. පොහොර භාවිතය වැඩිවීම හා පසුගිය වසරේ දිගටම පැවති හිතකර කාලගුණික සාධක මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය.

සමුද්‍ර සහ මිරිදිය ධීවර යන දෙඅංශයෙහි අඛණ්ඩව ඉහළ යමින් පැවති නිෂ්පාදනය හේතුකොටගෙන ධීවර නිෂ්පාදන සියයට 7.6 කින් ඉහළ ගිය බවට ඇස්තමේන්තු කර ඇත. රාජ්‍ය ආයෝජන වැඩපිළිවෙල තුළින් සමුද්‍ර ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් පුළුල් කිරීම හා පෞද්ගලික අංශය විසින් යාන්ත්‍රික බෝට්ටු සඳහා වන ආයෝජන ඉහළ නැංවීම, මෙම අංශයෙහි වර්ධනයට දායක විය.

නිමැවුම් කර්මාන්ත අංශය, 1998 දී වූ සියයට 6.3 ක වර්ධනය හා සසඳන විට, 1999 දී සියයට 4.4 කින් වර්ධනය විය. ලෝක පරිමාණ ආර්ථික පරිහානි තත්වයේ ප්‍රතිඵලයක් ලෙස වර්ෂයේ ප්‍රථම භාගයේදී විදේශ ඉල්ලුමෙහි පහත වැටීම; මෙම මන්දගාමී වර්ධනයට ප්‍රධාන හේතුව විය. මෙම සාධකය, ප්‍රධාන වශයෙන් රබර් සහ සම් නිෂ්පාදන, පිඟන් භාණ්ඩ හා ස්වර්ණාභරණ වැනි කර්මාන්ත රාශියකට අයහපත් ලෙස බලපෑවේය. කාර්මික අපනයනයන් යථා තත්වයට පත්වීම පිළිබිඹු කරමින්, වර්ෂයේ දෙවන භාගයේදී කර්මාන්ත ගණයන් බොහොමයක යහපත් ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබුණි. 1998 දී සියයට 4.5 ක වර්ධනයට සාපේක්ෂව ඇඟලුම් කර්මාන්තය සියයට 6.9 ක වේගවත් වර්ධනයක් වාර්තා කළ අතර, පංගු නොවන අයිතමයන් කරා යොමුවීම සහ ඉහළ එකතු කළ අගයකින් යුත් අයිතමයන් නිෂ්පාදනය පුළුල් කිරීම මෙයට විශාල වශයෙන් බලපෑවේය. පසුගිය වසර හා සසඳන විට ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය ද වේගවත් වර්ධනයක් අත්කර ගත් අතර එය, ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනයෙහි සැලකිය යුතු නිමැවුම් වර්ධනය හා දියමන්ති සැකසුම සඳහාවූ අපනයන ඉල්ලුම ප්‍රතිස්ථාපනය කරගනු ලැබීම හේතුවෙන් සිදුවිය.

කෘෂි සැකසුම් කර්මාන්තයන්ට අයත්වන තේ, රබර් සහ පොල් මද නිෂ්පාදන සියයට 3.8 කින් ඉහළ ගියේය. සැකසුම් කර්මාන්තයෙහි වේගවත් වර්ධනය සිදුවූයේ කපාපු පොල් නිමැවුම පසුගිය වසරට වඩා සියයට 43 කින් ඉහළයාම නිසාය. කුඩා කර්මාන්ත උප අංශය සියයට 4.8 කින් වර්ධනය වූ අතර එයට, පරිගණක යන්ත්‍ර හා සන්නිවේදන මෙවලම් එකලස් කිරීම, ලුහු ඉංජිනේරු කටයුතු සහ වී මෝල් ක්‍රියාකාරකම් ආදිය ව්‍යාප්ත වීම සාධක විය.

1998 වර්ෂයේදී වූ සියයට 7.1 ක වර්ධනයට සාපේක්ෂව 1999 වර්ෂයේදී ඉදිකිරීම් අංශය සියයට 4.8 ක වර්ධනයක් සටහන් කළේය. රටෙහි නිවාස ඉදිකිරීම හා වෙනත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා 1998 වර්ෂයේ අයවැය මගින් පෞද්ගලික අංශයේ සහභාගිත්වය උනන්දු කරවීම සඳහා දෙන ලද දිරි ගැන්වීම් මෙම අංශයෙහි වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් සාධක විය. තවද, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාවට නංවන ලද රාජ්‍ය අංශයේ නිවාස වැඩසටහන, විශේෂයෙන් ජනඋදාන සහ ග්‍රාමීය නිවාස යෝජනා ක්‍රම, 1999 වසරේදී සැලකිය යුතු වර්ධනයක් පෙන්වීය. මේ අනුව ණය සපයන විවිධ ආයතන තුළින් නිවාස ඉදිකිරීම් සඳහා සපයන ලද ණය ප්‍රමාණයෙහි ද සැලකිය යුතු වර්ධනයක් පෙන්වීය. කෙසේ වුවද: සිමෙන්ති, ඇස්බෙස්ටෝස්, යකඩ සහ පී.වී.සී සහ සෙවිලි ද්‍රව්‍ය වැනි ගොඩනැගිලි උපකරණවල සුලභත්වය, ඉදිකිරීම් අංශයෙහි වර්ෂයේ දෙවන භාගයෙහි වූ වේගවත් වර්ධනය විදහා දැක්වීය.

පසුගිය වසරේ සියයට 5.4 කින් පහත වැටුණු පතල් සහ කැණීම් අංශය 1999 වසරේදී 4.1 ක ප්‍රතිශතයකින් වර්ධනය විය. නැගෙනහිර ආසියාතික රටවල වූ ආර්ථික අර්බුදය හේතුවෙන් ඉතා අයහපත් බලපෑමකට ලක්වූ මැණික් පතල් කර්මාන්තය, 1999 වසරේ දෙවන භාගයේ දී ඉහත රටවලින් ඇතිවූ අපනයන ඉල්ලුම කෙරෙහි ප්‍රතිචාර දක්වමින් වර්ධනය විය. ජපානයට කෙරෙන අපනයනයන් මන්දගාමී වීම හේතුකොටගෙන ඛණිජවැලි නිෂ්පාදනය පහත වැටීම ඉහත කී වර්ධනය අඩ වශයෙන් අඩාල කරවිය. ඉදිකිරීම් අංශයේ සිදු වූ අඛණ්ඩ වර්ධනය හේතුවෙන් වැලි, කලුගල් කැබලි, හුණු, ගඩොල් සහ සෙවිලි උළු වැනි ප්‍රධාන ගොඩනැගිලි උපකරණ සඳහා වූ ඉල්ලුම ඉහළයාම හේතුවෙන් කැණීම් උප අංශය සියයට 4.8 කින් වර්ධනය විය.

ප්‍රවාහන, ගබඩාකිරීම් සහ සන්නිවේදන අංශය පසුගිය වසරේ වූ සියයට 7.7 ක වර්ධනයට සාපේක්ෂව 1999 වර්ෂයේදී සියයට 8.1 කින් ඉහළ ගිය අතර එය, මෑත වසර වලදී සටහන් කළාවූ වර්ධන වේගය තවදුරටත් පවත්වාගෙන යාමකි. දුරකථන සන්නිවේදන උප අංශය තුළ පමණක් සිදුවූ සියයට 39.2 ක වර්ධනය මෙම ඉහළයාම කෙරෙහි වඩාත් බලපෑ අතර එය මෙම අංශයෙහි වර්ධනයට සියයට 26 කින් දායක විය. ප්‍රවාහන හා වරාය සේවාවන්හි වර්ධනය මන්දගාමී වුවද 1999 තුළදී දුරකථන සන්නිවේදන අංශයෙහි සිදුවූ ශක්තිමත් වර්ධනය, අනෙකුත් උප අංශ දෙකෙහි දක්නට ලැබුණු පසුබෑස්ම සමනය කෙරුනු අතර, ප්‍රවර්ධන වේගය පවත්වාගෙන යාමට ද සමත් විය.

ශ්‍රී ලංකා ටෙලිකොම් සහ පෞද්ගලික දුරකථන සේවාවන්හි 1999 වර්ෂය තුළ ලේඛනගත වූ ග්‍රාහකයන්ගේ සංඛ්‍යාවෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. 1999 තුළදී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය නව දුරකථන සැපයුම් 133,700 ක් පමණ ලබාදීමට සමත්විය. සෙලියුලර් දුරකථන ග්‍රාහකයන්ගේ සංඛ්‍යාව සියයට 47 කින් ඉහළ ගිය අතර රැහැන් රහිත ප්‍රාදේශීය පුඩු සම්බන්ධතා දුරකථන සංඛ්‍යාව සියයට 35 කින් ඉහළ ගියේය. මේ අනුව, දුරකථන ඝණත්වය (පුද්ගලයන් 100 දෙනකු සඳහා ස්ථානගත දුරකථන සංඛ්‍යාව) 1998 දී වූ සියයට 2.79 සිට 1999 දී සියයට 3.52 දක්වා වැඩිවෙමින් සියයට 26 කින් වර්ධනය විය.

**2.1 සංඛ්‍යා සටහන**

**ස්ථාවර (1996) සාධක වියදම් මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය**

| අංශය | වැඩිවීමේ අනුපාතය | | ද.ජා.නි.හි වෙනස්වීමට ප්‍රතිශතක දායකත්වය | | ද.ජා.නි.හි ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | 1998(අ) | 1999(අ) | 1998 (අ) | 1999(අ) | 1998(අ) | 1999(අ) |
| 1. කෘෂිකර්මය, දුව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය | 2.5 | 4.5 | 11.9 | 25.2 | 21.5 | 21.7 |
| කෘෂිකර්මය | 1.8 | 4.4 | 6.6 | 19.1 | 16.8 | 16.9 |
| තේ | 1.1 | 1.3 | 0.4 | 0.5 | 1.5 | 1.4 |
| රබර් | -9.0 | 1.0 | -1.0 | 0.1 | 0.5 | 0.4 |
| පොල් | -3.2 | 9.1 | -1.3 | 4.0 | 1.7 | 1.8 |
| වී | 18.3 | 6.6 | 11.9 | 5.9 | 3.4 | 3.5 |
| අනෙකුත් | -1.5 | 3.4 | -3.4 | 8.6 | 9.8 | 9.7 |
| දුව ආදී වන ද්‍රව්‍ය | 1.2 | 1.3 | 0.5 | 0.7 | 2.0 | 1.9 |
| ධීවර | 8.3 | 7.6 | 4.8 | 5.5 | 2.8 | 2.9 |
| 2. පතල් හා කැනීම් කටයුතු | -5.4 | 4.1 | -2.3 | 1.9 | 1.8 | 1.8 |
| 3. නිමැවුම් කර්මාන්ත | 6.3 | 4.4 | 22.9 | 19.7 | 17.1 | 17.2 |
| තේ, රබර් සහ පොල් මද නිෂ්පාදන සැකසීම | -1.2 | 3.8 | -0.6 | 2.1 | 2.2 | 2.2 |
| නිෂ්පාදන කර්මාන්ත | 7.6 | 4.5 | 21.7 | 15.9 | 13.6 | 13.7 |
| කුඩා කර්මාන්ත | 6.5 | 4.8 | 1.8 | 1.6 | 1.3 | 1.3 |
| 4. ඉදිකිරීම් | 7.1 | 4.8 | 10.7 | 8.9 | 7.1 | 7.2 |
| 5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා | 10.1 | 9.5 | 3.0 | 3.5 | 1.4 | 1.5 |
| 6. ප්‍රවාහනය, ගබඩා කිරීම හා සංනිවේදනය | 7.7 | 8.1 | 18.2 | 23.8 | 11.3 | 11.8 |
| 7. තොග සහ සිල්ලර වෙළෙඳාම | 4.5 | 1.0 | 21.7 | 5.7 | 22.5 | 21.9 |
| ආනයනය | 8.2 | -1.4 | 17.0 | -3.6 | 10.0 | 9.5 |
| අපනයනය | 0.1 | 6.1 | 0.1 | 3.8 | 2.4 | 2.5 |
| දේශීය | 2.0 | 2.1 | 4.6 | 5.5 | 10.1 | 10.0 |
| 8. බැංකු රක්ෂණ සහ නිශ්චල දේපල | 6.4 | 4.6 | 10.2 | 9.1 | 7.6 | 7.7 |
| 9. නිවාස අයිතිය | 1.2 | 1.2 | 0.5 | 0.6 | 1.9 | 1.9 |
| 10. රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක කටයුතු | 3.0 | 4.2 | 3.3 | 5.4 | 5.0 | 5.0 |
| 11. සේවා (අන් තැනක සඳහන් නොවන) | 3.7 | 9.8 | 3.2 | 10.1 | 4.0 | 4.2 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය | 4.7 | 4.3 | 103.2 | 113.9 | 101.3 | 101.8 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම | | | -3.2 | -13.9 | -1.3 | -1.8 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය | 4.6 | 3.8 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රාග්ධන ආයෝජනය සැලකිය යුතු ලෙසින් ඉහළයාම සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සහ පෞද්ගලික දුරකථන සේවාවන් විසින් හඳුරුවනු ලැබූ නව සංවර්ධන ව්‍යාපෘතීන් නිසා මෙම ප්‍රතිඵල ළඟා කරගත හැකිවිය. මෙයට අමතරව, නව තාක්ෂණ භාවිතය හා සේවා සපයන්නන් අතර තරඟකාරිත්වය ඉහළයාම තුළින් මෙම කර්මාන්තයෙහි සේවා තත්වයන් ගුණාත්මක බවින් වර්ධනය විය. ශ්‍රී ලංකා ටෙලිකොම්හි දුරකථන පහසුකම් ලබා ගැනීම සඳහා පොරොත්තු ලේඛනයෙහි ලියාපදිංචිව සිටින සංඛ්‍යාව, ඉදිරි වර්ෂ තුළදී මෙම කර්මාන්තය තවදුරටත් වර්ධනය වීමේ ශක්‍යතාව පෙන්නුම් කරයි. මේ අතර දුරකථන සන්නිවේදන අංශයෙහි ප්‍රසාරණ ව්‍යාපෘති, ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වන ජපන් බැංකුවත්, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයත් එකතුව කටයුතු මෙහෙයවනු ලබන අතර, එමගින් රටෙහි ග්‍රාමීය අංශය තුළ ජාත්‍යන්තර දුරකථන සන්නිවේදන පහසුකම් සැපයීමට ඉලක්ක කොටගෙන සිටී. තැපැල් කාර්යාල ජාලය හා සේවා තත්වයන් ව්‍යාප්ත කිරීම තුළින් වර්ෂය තුළ තැපැල් සේවාවන්ද වර්ධනය විය.

1999 වර්ෂය තුළ මන්දගාමී වර්ධන ප්‍රවණතාවයක් සටහන් කරමින් වරාය සේවාවන් සියයට 1 ක සුළු වර්ධනයක් පෙන්වීය. නැව්බඩු හැසිරවීම සියයට 1 කින් ඉහළගිය අතර, ප්‍රතිනැව්ගත කිරීම් සියයට 3 කින් අඩුවිය. සියළුම වරායයන්හි මුළු ආදායම, පසුගිය වසරේදී සියයට 24 කින් වර්ධනය වූ අතර, 1999 වසරේදී පසු බෑස්මක් පිළිබිඹු කරමින් එය නොවෙනස්ව පැවතුණි. අසල්වැසි වරායයන්ගෙන් එල්ල වූ ප්‍රබල තරඟකාරිත්වය සහ කලාපීය වාණිජ ක්‍රියාකාරිත්වයෙහි සංකෝචනය, වරාය ක්‍රියාකාරිත්වයෙහි වර්ධනීය අවස්ථාවන්ට අභියෝගයක් වූ බවක් පෙනෙන්ට තිබුණි. මෙම අභියෝගයන්ට මුහුණදීමට හැකි වන පරිදි ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඵලදායීතාවය ඉහළ නැංවීමට හා වරාය පහසුකම් පුළුල් කිරීමට ව්‍යාපෘතීන්

**2.2 සංඛ්‍යා සටහන**

**අනෙකුත් කෘෂිකාර්මික උප අංශයේ සංයුතිය**

| අංශය | 1996 ස්ථාවර මිල අනුව එකතු කළ වටිනාකම (රු.දශලක්ෂ) | | |
|---|---|---|---|
| | 1997(අ) | 1998(අ) | 1999(අ) |
| එළවළු | 31,676 | 33,126 | 35,234 |
| අතුරු ආහාර භෝග (ආ) | 18,501 | 15,577 | 15,871 |
| සුළු අපනයන භෝග (ඇ) | 7,874 | 7,825 | 7,666 |
| උක්ගස් | 1,203 | 1,202 | 1,281 |
| දුම්කොළ | 1,553 | 1,569 | 1,484 |
| සත්ව පාලනය (ඈ) | 6,293 | 6,560 | 6,597 |
| අනෙකුත් | 8,763 | 8,837 | 9,192 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) අතුරු ආහාර භෝග කාණ්ඩය ප්‍රධාන වශයෙන් අර්තාපල්,මිරිස්, රතුළූණු, ලොකුළූණු, මුංඇට, කව්පි, කුරක්කන් ඇතුළු අනෙකුත් අතුරු ආහාර භෝග වලින් සමන්විත වේ.

(ඇ) සුළු අපනයන භෝග කාණ්ඩය ප්‍රධාන වශයෙන් කෝපි, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, කජු, බුලත් හා අනෙකුත් සුළු අපනයන භෝග වලින් සමන්විත වේ.

(ඈ) සත්ව පාලන කාණ්ඩය ප්‍රධාන වශයෙන් කිරි, බිත්තර, කුකුල් මස් හා අනෙකුත් මස් නිෂ්පාදන කටයුතුවල එකතු කළ අගයන්ගෙන් සමන්විත වේ.

කිහිපයක් ක්‍රියාවට නංවමින් සිටියි. කොළඹ වරායෙහි උතුරු පියර සංවර්ධන ව්‍යාපෘතිය (ii අදියර), ගාලු වරායෙහි නව ජැටිය ඉදිකිරීම, ත්‍රිකුණාමල වරායෙහි නව පියරයක් ඉදිකිරීම, 1998 දී පෞද්ගලික අංශයේ සහභාගිත්වයද සහිතව අරඹන ලද එළිසබෙත් රැජින තටාකාංගනයට කරන ලද වැඩිදියුණු කිරීම් මේවා අතර විශේෂිත වෙයි.

මහා මාර්ග, දුම්රිය හා ගුවන් සේවා අයත් වන ප්‍රවාහන උප අංශය, 1999 වසර තුළදී සියයට 2.9 කින් වර්ධනය විය. මහා මාර්ග ප්‍රවාහන සේවාවන්හි ප්‍රසාරණයට හේතුවූයේ කෘෂිකාර්මික, නිමැවුම් හා ඉදිකිරීම් අංශයන්හි ව්‍යාප්තිය නිසා ප්‍රවාහන සේවාවන්හි ඉල්ලුම වර්ධනය වීමයි. ගුවන් ප්‍රවාහන සේවාවන්හි වර්ධනය 1999 වසර තුළ සංචාරකයන්ගේ පැමිණීමෙහි වැඩිවීම නිසා සිදුවිය. ශ්‍රී ලංකන් එයාර් ලයින් විසින් පියාසර කරන ලද මගී කිලෝමීටර සංඛ්‍යාව, 1998 දී වූ මිලියන 4,155 සිට 1999 වර්ෂයේදී මිලියන 5,145 දක්වා ඉහළ ගියේය.

බැංකු, රක්ෂණ සහ නිශ්චල දේපල අංශය, 1998 වර්ෂයේදී වූ සියයට 6.4 ක වර්ධනයට සාපේක්ෂව 1999 වර්ෂයේදී සියයට 4.6 කින් වර්ධනය විය. බැංකු අංශයෙහි එකතු කළ අගයෙහි මන්දගාමී වර්ධනය කෙරෙහි විශේෂයෙන් තොග සහ සිල්ලර වෙළඳම පහත වැටීම බලපෑ අතර ආර්ථිකයෙහි මන්දගාමීත්වය ද බලපෑවේය. කෙසේ වුවද රක්ෂණ සහ කල්බදු උප අංශයන්හි ක්‍රියාකාරිත්වය 1999 වර්ෂයේදී සැලකිය යුතු ලෙස ප්‍රසාරණය විය.

දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 22 ක දයකත්වයක් දක්වූ තුන්වැනි විශාලතම අංශය වන තොග සහ සිල්ලර වෙළඳම් අංශය, 1998 දී වූ සියයට 4.5 ට සාපේක්ෂව 1999 තුළදී සියයට 1 ක් වූ මන්දගාමී අනුපාතිකයකින් වර්ධනය විය. මෙම අඩු වර්ධනය ප්‍රධාන වශයෙන් ආනයනයන් සංකෝචනය වීමේ ප්‍රතිඵලයකි. ආනයන වෙළඳමෙහි පරිමාව 1999 වසර තුළදී සියයට 1.4 කින් පහත වැටුණු බවට ඇස්තමේන්තු කර ඇත. 1999 වර්ෂයේ අග භාගයේදී යථා තත්වයට පත් අපනයන උප අංශය, 1999 වර්ෂය තුළදී සියයට 6.1 කින් වර්ධනය විය. වාණිජ කටයුතුවල වර්ධනය සැලකියයුතු මට්ටමකින් පහත වැටීම වාණිජ බැංකුවල හා භාණ්ඩ ප්‍රවාහන උප අංශයන්හි ලාභදායීතාවය අඩුවීමට හේතු වූ අතර එය සමස්ත ආර්ථික ක්‍රියාකාරිත්වය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. අපනයන, කෘෂිකර්ම, කාර්මික හා ඛණිජ යන ප්‍රධාන ගණයන් තුනෙහි අපනයන පරිමාව ප්‍රසාරණය විය. ඛණිජ අපනයනයන්හි ප්‍රධානතම ගණය වූ මැණික් අපනයනය, නැගෙනහිර ආසියාතික රටවලින් හා ජපානයෙන් වූ ඉල්ලුම වර්ධනය වීම හේතුකොටගෙන සියයට 22.9 කින් ඉහළ ගියේය.

ආනයන වෙළඳමෙහි එකතු කළ අගය 1998 සම කාලච්ඡේදයේදී වාර්තා වූ සියයට 8.2 ක වර්ධනයට සාපේක්ෂව, 1999 වර්ෂයේදී සියයට 1.4 කින් පහත වැටුණි. පාරිභෝගික සහ අන්තර් භාණ්ඩ ආනයනය පිළිවෙලින් සියයට 0.3 කින් හා සියයට 0.5 කින් පහත වැටුණ ද, ආයෝජන භාණ්ඩ ආනයනය 1999 දී වාර්තාගත ලෙස සියයට 6 කින් ඉහළ ගියේය. ශ්‍රී ලංකන් ගුවන් සේවයේ යානා සංඛ්‍යාව ප්‍රතිසංඛ්‍යානගත කිරීමේ සැලසුම යටතේ ඇ.එ.ජ.ඩොලර් දශ ලක්ෂ 298 ක් වටිනා ගුවන් යානා තුනක අගය පසුව කියන ලද්දට එනම්, ආයෝජන භාණ්ඩ ආනයනය තුළ අන්තර්ගත වෙයි. ගුවන් යානා අත්හළ විට, ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 14.2 කින් පහත වැටුණි.

ආර්ථිකයේ මූලික හා ද්විතීයික අංශයන්හි ක්‍රියාකාරිත්වය පුළුල් කිරීම, 1999 වර්ෂයේදී දේශීය වෙළඳම කෙරෙහි ධනාත්මක ලෙස දයක විය. වර්ෂය තුළදී කෘෂිකාර්මික නිමැවුම් හි වර්ධනයට සමගාමීව ආහාර ද්‍රව්‍ය වෙළඳමෙහි සැලකිය යුතු දියුණුවක් දක්නට ලැබුණි. වඩාත් හොඳ තොග බෙදාහැරීමේ පහසුකම් ඇතිකිරීම හා ඇඳුණු වෙළඳපොළ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් ආහාර ද්‍රව්‍යවල මිල ඉහළයාම වර්ෂය තුළදී පාලනය කිරීමට හැකිවිය. දේශීය වෙළඳම වර්ෂය තුළදී සියයට 2.1 කින් ඉහළ ගියේය.

ප්‍රධාන සේවාවන් යටතේ වර්ගීකරණය නොකළ "අනෙකුත් " සේවා අංශය යනුවෙන් ගැනෙන සේවා ක්‍රියාකාරකම් 1998 දී වූ සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව 1999 වර්ෂය තුළදී සියයට 9.8 කින් වර්ධනය විය. පෞද්ගලික සහභාගිත්වය වැඩිකිරීම හා ආර්ථික කටයුතුවල විශාල පරිමාණ වූ ව්‍යාප්තිය මෙම අංශයෙහි වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑවේය. මෙම අංශය යටතෙහි ගැනෙන උප වර්ගීකරණ විශාල සංඛ්‍යාව අතර: හෝටල් සේවය, පරිගණක මෘදුකාංග හා දත්ත සම්බන්ධ සේවා, ප්‍රචාරණය සහ විනෝදය සැපයීමේ සේවා යන උප අංශ, ඉහළ වර්ධනයක් අත්පත් කරගත් සේවාවන් ලෙස හඳුනාගෙන ඇත.

හෝටල් හා ආශ්‍රිත සේවාවන්, 1999 වසර තුළදී මූර්ත වශයෙන් සියයට 16.4 ක වර්ධනයක් සටහන් කොට ඇත. 1999 වසර තුළදී සංචාරකයන්ගේ පැමිණීම සියයට 15 කින් ඉහළ යාමත් සමග ඇඳුණු දේශීය සංචාරක සේවාවන් හි වර්ධනය වීමේ ප්‍රවණතාවය, මෙයට හේතුවිය. මෑත වසර වලදී පාරිභෝගික හැසිරීම් රටාවෙහි සිදුවූ වෙනස්වීමත් සමග නිවසේ සකසන ලද ආහාර පාන සැපයීමේ සේවා සහ පිසූ ආහාර විකුණුම් පොළවල්ද වේගයෙන් ව්‍යාප්ත විය. සෞඛ්‍ය සේවා, විශේෂයෙන් පෞද්ගලික අංශයෙහි සෞඛ්‍ය සේවාවන්හි ද සැලකිය යුතු දියුණුවක් වසර තුළදී දක්නට ලැබිණ. දේශීය සහ විදේශීය පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් බිහි වූ පෞද්ගලික රෝහල් හා සෞඛ්‍ය සායන සංඛ්‍යාවෙහි වැඩිවීම තුළින් මෙම සංවර්ධනය පිළිබිඹු විය. පෞද්ගලික අංශයේ සහභාගිත්වය නිසා සීඝ්‍ර වර්ධනයක් අත්කර ගනිමින් සිටින තවත් කෙෂ්ත්‍රයක් නම් අධ්‍යාපන උප අංශයයි. මෙම අංශය සමස්තයක් වශයෙන් සියයට 4.6 ක වේගයෙන් වැඩුණි. සංවිධිත පෞද්ගලික අංශය, සියයට 23.5 ක අති විශාල ඉහළ මූර්ත වර්ධන අනුපාතිකයක් අත්කර ගත්තේය. පසුගිය වසර කීපය තුළ ඉහළ යමින් පවතින ඉල්ලුමට සරිලන පරිදි, සෑම කෙෂ්ත්‍රයක්ම ආවරණය වන්නාවූ අධ්‍යාපනික පාඨමාලා සහිත අධ්‍යාපන ආයතන විශාල සංඛ්‍යාවක් බිහි විය. මෙම වර්ධනයෙහි කැපී පෙනෙන ලක්ෂණය වන්නේ මෙම පාඨමාලා වලින් බොහොමයක් අධ්‍යාපනික ස්වභාවයේ ඒවාට වඩා වෘත්තීයමය ස්වරූපයේ පාඨමාලා වීමය. වඩාත් දේශ දර්ශනයට ලක් වන ඌණත්වය නම් රාජ්‍ය අංශය විසින් අනුග්‍රාහකත්වය දක්වන අධ්‍යාපන ක්‍රමය තුළින් බිහි කරනු ලබන බලකාය, නව ආර්ථික රටාව විසින් ඇතිකරනු ලබන ඉල්ලුම සමග නොගැලපෙන ස්වභාවය ය. පෞද්ගලික අධ්‍යාපනික සේවාවන් තුළ මෑතදී සිදුවූ වර්ධනය මෙම හිඩැස එක්තරා දුරකට පිරවීමට සමත් විය. රජය පැහැදම දරන විශ්ව විද්‍යාල අධ්‍යාපනයට වඩා පෞද්ගලිකව වියදම් කළ යුතු වෘත්තීයමය පාඨමාලා හැදෑරීමට සමහර සිසුන් පෙළඹීම මෙම ප්‍රවණතාවයේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක. සේවා අංශය තුළ දැකිය හැකි තවත් වර්ධනයක් නම් සමහර සේවාවන් පෞද්ගලික අංශයේ සහභාගිත්වයත් සමග ආයතනගත වීමය. පෞද්ගලික ආරක්ෂක සේවා සහ මුර සේවා මේවාට උදාහරණය. සියයට 10 ක අනුපාතිකයකින් මෙම අංශයන් ද වර්ධනය විය. ගෘහෝපකරණවල සිට වාහන දක්වා සෑම වර්ගයකටම අයත් භාණ්ඩ අළුත්වැඩියා කිරීමද වර්ධනය වෙමින් පවතින තවත් අංශයකි.

## 2.3 වියදම

දේශීය ආර්ථික ක්‍රියාවලිය විසින් ජනනය කරනු ලබන සමස්ත ඉල්ලුම මනිනු ලබන්නේ ආර්ථිකයෙහි පෞද්ගලික හා රාජ්‍ය අංශයන්හි පරිභෝජන හා ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) වියදමෙහි එකතුව වන දළ දේශීය වියදම මගිනි. දළ දේශීය වියදම පසුගිය වසරට වඩා සියයට 10.4 ක වැඩිවීමක් පිළිබිඹු කරමින් රුපියල් බිලියන 1,192 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

පරිභෝජන වියදම රුපියල් බිලියන 890 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය, පසුගිය වසරේ වාර්තා වූ රුපියල් බිලියන 823 ට වඩා සියයට 8 කින් ඉහළ යාමකි. සමස්ත පරිභෝජන වියදමින් සියයට 90 කට දයක වූ පෞද්ගලික පාරිභෝජන වියදම 1998 වසරේදී වූ රුපියල් බිලියන 724 සිට 1999 දී රුපියල් බිලියන 790 දක්වා සියයට 9.1 ක වර්ධනයක් පෙන්නුම් කළේය. 1998 දී මෙම වර්ධනය, සියයට 11.8 කි. මෙම අඩු වර්ධනයට ප්‍රධාන හේතුව 1999 වසරේදී මිල ඉහළයාම අඩු මට්ටමක පැවතීමය. ආනයනිත භාණ්ඩ හා සාධක නොවන සේවා සඳහා පෞද්ගලික පරිභෝජන වියදම සියයට 10 කින් පමණ ඉහළ ගිය අතර, එහි 1998 වසරේදී වූ ඉහළයාම සියයට 15 ක් විය. ආනයනිත අයිතමයන් අතරින් ආහාර හා කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ සඳහා කෙරෙන වියදම, පසුගිය වසරට වඩා සියයට 10 කින් ඉහළ ගිය අතර ආනයනිත සාධක නොවන සේවා සඳහා වූ වියදම ආන්තික වශයෙන් ඉහළ ගියේය. දේශීය වශයෙන් නිෂ්පාදනය කරන භාණ්ඩ ගණයෙහි; සහල්, පොල් නිෂ්පාදන, අනෙකුත් ආහාර භෝග සහ මත්ස්‍ය නිෂ්පාදන සැලකියයුතු ලෙස වර්ධනය වූ අතර, එය මෙම අයිතමයන්හි දේශීය නිෂ්පාදනයන් ඉහළයාම නිසා සිදු වූවකි. කාර්මික භාණ්ඩ සඳහා වන වියදම පසුගිය වසරට වඩා සියයට 8 කින් වාර්තාගත ලෙස ඉහළ ගිය අතර ඒ හා සමග සැකසූ ආහාර, ඇඳුම් සහ ප්ලාස්ටික් භාණ්ඩ පරිභෝජනයෙහි සැලකිය යුතු වර්ධනයක් පෙන්විය.

1998 වසරේදී සියයට 17.9 කින් වර්ධනය වූ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය රුපියල් බිලියන 301 දක්වා ඉහළ ගිය බවට ඇස්තමේන්තු කොට ඇත. සමස්ත ආයෝජනයන්ගෙන් සියයට 88 කින් සමන්විත පෞද්ගලික අංශයේ ආයෝජන, ප්‍රවේගවත් ලෙස සියයට 20.2 කින් වර්ධනය වූ අතර, රාජ්‍ය ආයෝජනයන්හි එම වර්ධන ප්‍රතිශතය සියයට 5.6 කි. පෞද්ගලික අංශයේ ආයෝජන: කර්මාන්ත, නිවාස ඉදිකිරීම්, ප්‍රවාහන සහ සන්නිවේදන යන ප්‍රධාන අංශයන් කෙරෙහි යොමු වූ අතර රාජ්‍ය ආයෝජන; මහා මාර්ග, වාරිමාර්ග සහ ජල සම්පාදන, ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සහ නඩත්තුව කෙරෙහි යොමු කැරිණි.

## 2.4 පවත්නා සම්පත් හා එහි උපයෝජනය

දළ දේශීය නිෂ්පාදිතයෙන් හා ආනයනිත භාණ්ඩ සහ සාධක නොවන සේවාවන්ගෙන් (විදේශ සම්පත්) සමන්විත වන ආර්ථිකයේ සමස්ත සම්පත් ප්‍රමාණය 1998 දී වාර්තා කළ රුපියල් බිලියන 1,448 සිට 1999 වර්ෂයේදී රුපියල් බිලියන 1,583 දක්වා වර්ධනය වී ඇත. මෙම රුපියල් බිලියන 135 ක්වූ වර්ධනයෙන් රුපියල් බිලියන 93 ක් පවත්නා වෙළඳපොළ මිල යටතේ දළ දේශීය නිශ්පාදිතයේ ඉහළ යාමෙන් සමන්විත වන අතර, විදේශ සම්පත්වල වර්ධනය රුපියල් බිලියන 42 කි. මුළු සම්පත් ප්‍රමාණයෙන්

**2.3 සංඛ්‍යා සටහන**
**සම්පත් සංයුතිය සහ උපයෝජනය (1996 ස්ථාවර මිල අනුව)**

| ශීර්ෂය | 1997(අ) | ප්‍රතිශතාත්මක දයකත්වය 1998(අ) | ප්‍රතිශතාත්මක දයකත්වය 1999(අ) | ප්‍රතිශතාත්මක වර්ධනය 1998 | ප්‍රතිශතාත්මක වර්ධනය 1999 |
|---|---|---|---|---|---|
| 1. මුළු සම්පත් | 100 | 100 | 100 | 6.8 | 5.2 |
| 1.1 වෙළඳ මිල අනුව ද.දේ.නි. | 69 | 67 | 67 | 4.7 | 4.3 |
| 1.2 භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | 31 | 33 | 33 | 11.5 | 7 |
| 2. උපයෝගීකරණය | 100 | 100 | 100 | 6.8 | 5.2 |
| 2.1 පරිභෝජනය | 59 | 59 | 58 | 7 | 5.3 |
| 2.2 දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 16 | 17 | 18 | 15.3 | 6.4 |
| 2.2.1 රජය | 2 | 2 | 2 | 11.5 | -2.8 |
| 2.2.2 පෞද්ගලික අංශය හා රජයේ සංස්ථා | 14 | 15 | 16 | 15.9 | 7.8 |
| 2.3 තොග වෙනස්කම් | 0 | 0 | 0 | -30.5 | -45.9 |
| 2.4 භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන | 25 | 24 | 24 | 1.0 | 4.0 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 56 ක් පරිභෝජනයට ද, සියයට 19 ක් ප්‍රාග්ධන සම්පාදනයට ද යෙදවූ අතර, ශේෂය වූ සියයට 25 භාණ්ඩ අපනයනය හා සාධක නොවන සේවා සඳහා දයක විය. පවත්නා සම්පත්, ස්ථාවර මිල (1996) යටතේ තක්සේරු කරනු ලබන අතර එය, 1998 වසරේදී වූ සියයට 6.8 ක වර්ධනයට සාපේක්ෂව 1999 වසරේදී සියයට 5.2 කින් ඉහළ ගියේය. පරිභෝජන වියදම 1999 තුළදී සියයට 5.3කින් ඉහළ ගිය අතර දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය රුපියල් බිලියන 237 ක් දක්වා සියයට 6.4 කින් වර්ධනය විය.

## 2.5 දේශීය සහ ජාතික ඉතිරි කිරීම්

දේශීය ඉතිරිකිරීම් ඇස්තමේන්තු කරනු ලබන්නේ ආයෝජනය සහ භාණ්ඩ හා භාණ්ඩ නොවන සාධක සේවා වශයෙන් නිර්වචනය කරනු ලබන විදේශ සම්පත් හි වෙනස මගිනි. දේශීය ඉතිරිකිරීම් 1999 වසරේදී රුපියල් බිලියන 220 ලෙසට ඇස්තමේන්තු කර ඇත. එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 19.8 ක් වන අතර, මීට සාපේක්ෂව 1998 වසරේදී එය සියයට 19.1 ක් විය. ආයතනික හා කුටුම්බ ඉතිරිකිරීම් ඉහළයාම හා රාජ්‍ය තිර්-ඉතුරුම් පහත වැටීම 1999 වසර තුළදී දේශීය ඉතිරිකිරීම් ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හේතු වූ ප්‍රධාන සාධකයන් විය.

**2.4 සංඛ්‍යා සටහන**
**ජාතික ඉතිරි කිරීම් (පවත්නා වෙළෙඳ මිල අනුව)**

රුපියල් දශ ලක්ෂ

| කාණ්ඩය | 1996 | 1997(අ) | 1998(අ) | 1999(අ) |
|---|---|---|---|---|
| 1. වෙළඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය | 768,128 | 890,272 | 1,017,986 | 1,110,653 |
| 2. දේශීය ඉතිරිකිරීම් | 117,691 | 154,237 | 194,735 | 220,423 |
| 3. විදේශීය ශුද්ධ සාධක ආදයම | -11,258 | -9,409 | -11,556 | -17,813 |
| 4. විදේශීය ශුද්ධ පෞද්ගලික පැවරුම් | 39,242 | 46,472 | 54,785 | 62,438 |
| 5. ජාතික ඉතිරිකිරීම් | 145,674 | 191,301 | 237,965 | 265,048 |
| 6. දේශීය ඉතිරිකිරීම් අනුපාතිකය (අංක 2 අංක 1 හි % ලෙස) | 15.3 | 17.3 | 19.1 | 19.8 |
| 7. ජාතික ඉතිරිකිරීම් අනුපාතිකය (අංක 5 අංක 1 හි % ලෙස) | 19.0 | 21.5 | 23.4 | 23.9 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය ඉතිරිකිරීම්, ශුද්ධ විදේශීය සංක්‍රාම සහ ශුද්ධ සාධක ආදයම ආදියෙහි එකතුවක් වන ජාතික ඉතිරිකිරීම්, රුපියල් බිලියන 265 දක්වා ඉහළ ගිය අතර, එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 23.9 කි. ප්‍රධාන වශයෙන් මැද පෙරදිග සේවය කරන පුද්ගලයන්ගේ ආදයම් වලින් සමන්විත වන ශුද්ධ පෞද්ගලික සංක්‍රාම, 1999 වසර තුළදී මුළු ජාතික ඉතිරිකිරීම් වලින් හතරෙන් කොටසකට පමණ දයක විය.